# සිංහල ඩිප්ලෝමා පාඨමාලාව
# සිංහල අධ්‍යයනාංශය - කොළඹ විශ්වවිද්‍යාලය

**01. හැඳින්වීම**

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශය මගින් මෙම ඩිප්ලෝමා පාඨමාලාව පවත්වනු ලබන්නේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෘත්තිකයන්ගේ සිංහල භාෂාව, සාහිත්‍යය හා සංස්කෘතිය සම්බන්ධ දැනුම හා කුසලතා අභිවර්ධනය කිරීමේ අභිප්‍රායෙනි.

**02. මාධ්‍යය** - සිංහල

**03. පාඨමාලා ව්‍යුහය**

සිංහල භාෂාව, සාහිත්‍යය හා සංස්කෘතිය පිළිබඳ පාඨමාලා ඒකක 05 කින් සහ විචාරාත්මක නිබන්ධයකින් (වචන 4000) සමන්විත වේ.

DPS 001 - පුරාතන සිංහල සාහිත්‍යය
DPS 002 - සාහිත්‍ය ප්‍රවේශය
DPS 003 - නිර්මාණාත්මක ලේඛනය
DPS 004 - භාෂාව හා රචනය
DPS 005 - සිංහල සංස්කෘතිය
DPS 006 - විචාරාත්මක නිබන්ධය

**04. ඉලක්ක කණ්ඩායම**

මෙම පාඨමාලාව ප්‍රමුඛ වශයෙන් ම ගුරුවරුන්, කළමනාකාර සහකාර වෘත්තිකයන්, ජනමාධ්‍යවේදීන්, නිර්මාණකරුවන් වැනි රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෘත්තිකයන්ට මෙන්ම සිංහල භාෂාව, සාහිත්‍යය හා සංස්කෘතිය විධිමත්ව හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන්ට බෙහෙවින් වැදගත් වනු ඇත.

**05. සුදුසුකම්**

1. අ.පො.ස (උ/පෙ) විෂයන් තුනකින් සමත්වීම (ඕනෑම විෂය ධාරාවකින්) **හෝ**
2. අ.පො.ස (සා/පෙ) විභාගය සමත්වීම හා වසර දෙකක (02) සේවා පළපුරුද්ද

(අයදුම්කරුවන් සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණයක් /සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ.)

**06. කාලය**

එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවකි. (සෙනසුරාදා දිනවල පෙ.ව 9.00 - ප.ව 12.00 දක්වා දේශන පැවැත්වේ) දේශන සඳහා පැය 160 කි. කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ දී දේශන පැවැත්වේ.

**07. ඇගයීම් ක්‍රමවේදය**

පාඨමාලා ඒකකයක ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 75% ක් හා පැවරුම සඳහා ලකුණු 25% ක් බැගින් ලකුණු 100% ක් හිමිවේ. විචාරාත්මක නිබන්ධය සඳහා ලකුණු 100කි. සමත්වීම සඳහා සෑම පාඨමාලා ඒකකයකින්ම අවම වශයෙන් ලකුණු 50ක් ලබා ගත යුතුය. ඉහළ ලකුණු ලබා ගන්නා අපේක්ෂයන්ට විශිෂ්ට/සම්මාන සාමර්ථ්‍ය හිමි වනු ඇත.

**08. දේශක මණ්ඩලය**

සිංහල අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලය විසින් දේශන පවත්වනු ලැබේ.

**1. පාඨමාලා ගාස්තු**

| | |
|---|---|
| අයදුම්පත් ගාස්තුව | රු 500.00 |
| ලියාපදිංචි ගාස්තුව | රු 1000.00 |
| පාඨමාලා ගාස්තුව | රු 35000.00 |
| විභාග ගාස්තුව | රු 2000.00 |
| **එකතුව** | **රු 38500.00** |

**2. අයදුම් කිරීම**

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා ප්‍රකාශන අංශයෙන් හෝ සිංහලාංශයේ වෙබ් අඩවියෙන් ලබා ගත් අයදුම් පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර අදාළ සහතිකවල සහතික කරන ලද පිටපත් සමග පහත ලිපිනයට එවිය යුතුය. **මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස්කිරීමේ ගිණුමට බැරවන සේ යොමු අංක 304012500001 ට රු. 500.00 ගෙවා එම ලදු පත හා අයදුම්පත්‍රය 2021/11/01 දිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.**

**සිංහල ඩිප්ලෝමා පාඨමාලාව**
අධ්‍යයන හා ප්‍රකාශන අංශය
කොළඹ විශ්වවිද්‍යාලය
අංක 94
කුමාරතුංග මුනිදාස මාවත
කොළඹ 03

විමසීම් - 0112-500453